පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

විෂය නර්තනය

සතිය 48

ශ්‍රේණිය 13

Prepared by-N.K.A.Shrimathi.

R/ Mihindu Vidylaya

**නිපුණතාව 08- නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යනය කරමින් තොරතුරු ඉදිරිපත්කරයි.**

**නිපුණතා මට්ටම - 8.1 නර්තන කලාව හා සබැඳි අනුෂංගික අංග පිළිබඳ තොරතුරු විමසුමට ලක්කරයි.**

**ක්‍රියාකාරකම 8.1.4 - නර්තනය සඳහා අනුෂංගික අංගයක් ලෙස භාවිත වන සංගීතය පිළිබඳ විමසමු.**

- **නිවැරදි පිළිතුර තෝරන්න**

1.නර්තන ශෛලිය හා සංගීත ශෛලිය යන දෙකම එකම නමකින් හඳුන්වන්නේ .........................

1.Hip pop වලය. 2.කථකලි වලය. 3.කර්ණාටක වලය. 4.කථක් වලය.

2.බටහිර ජන සංගීතය හා ජන නර්තන කලාව ඒකාබද්ධව ගොඩනැගුණු රංග ශෛලියක් වන්නේ ...........................

1.කර්ණාටක 2.හින්දුස්තානි 3.සල්සා 4.උත්තර භාරතීය රාගදාරී සම්ප්‍රදාය

3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද නර්තන තරගාවලියක් වන්නේ .............................

1.සුපර් ඩාන්සර්ය. 2.ලිට්ල් ස්ටාර්ය. 3.කවීතා තරගාවලියය. 4.ඩාන්සින් ස්ටාර්ය.

4. නර්තනය සඳහා අනුෂංගික අංගයක් ලෙස සංගීත කලාව භාවිතා වීමෙන් එම නර්තනයේ ......................

1.රංග වස්ත්‍ර අලංකාර වේ. 2.භාවාත්මක ගුණය තීව්‍ර වේ. 3.නර්තනය අලංකාර වේ. 4.අංගරචනය අලංකාර වේ.

5. නර්තනය හා සංගීතය මනා ලෙස සුසංයෝග කොටගත් අධ්‍යතන චිත්‍රපට නිර්මාණයක් වන්නේ ........................

1. කුසපබාය 2.විජයබා කොල්ලය 3.රූකඩ පැංචිය 4.සිරි පැරකුම්ය

- **හිස්තැනට සුදුසු පිළිතුර සොයන්න .**

6.කතක් නර්තන සම්ප්‍රදායේ තාල ලක්ෂණ ගොඩනැගීමට ........... යන වාද්‍ය භාණ්ඩයේ තාල ලක්ෂණ හා වාදන විලාසයන්හේතු වී ඇත.

7. ....................... රචකයාට බැලේ කෘතියක නාමික අයිතිය හිමිවන්නේය.

8.චිත්‍රසේන,වජිරා යුවල නිර්මාණය කරන ලද ........ , ........ යන මුද්‍රා නාට්‍ය සඳහා දෙස් විදෙස් සංගීත ශෛලීන් ඇසුරුකොට ගෙන ඇත.

9. ..............., .................... වැනි චිත්‍රපට වල නර්තනය හා සංගීතය මනා ලෙස සුසංයෝග කොට ඇත.

10. රූපවාහිනී මාධ්‍යවල ප්‍රචාරය වන නර්තන .................. වැඩසටහන් තුළින් සංගීතයට වැඩි අවධානයක් යොමු කර ඇත'

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

11.ගීත නර්තන නිර්මාණයක් සඳහා සංගීත කලාවෙන් ලැබෙන පිටිවහල නම් කරන්න.

12.රූපවාහිණී රියැලිටි නර්තන වැඩසටහන් සඳහා සංගීතය යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.

13.නර්තනයෙහි ප්‍රාසාංගික බව තීව්‍ර කිරීම සඳහා සංගීයෙන් ලැබෙන පිටිවහල අගයන්න.

14.නර්තනයේ අනුෂංගික කලාවක් වන සංගීතය,ගායනා සමග නර්තනයට අන්තර්ගත වූයේ කෙසේදැයි කෙටියෙන් දක්වන්න.